# මහජනතාව වෙත දැනුම් දීමයි

මහජනතාව වෙනුවෙන් කොළඹ 1, ජනාධිපති මාවතේ අංක 30 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු මූලස්ථානයේ බිම් මහලේ දැනටමත් විවෘත කර ඇති කාසි නිකුත් කිරීමේ කවුළුව හරහා මුදල් නෝට්ටු හුවමාරු කිරීම ද 2019 අගෝස්තු 01 වන බ්‍රහස්පතින්දා දින සිට ආරම්භ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව බලාපොරොත්තු වේ.



| | |
|---|---|
| කවුළුව විවෘතව තබන දිනයන් | රජයේ සහ බැංකු නිවාඩු දිනවල හැර සෑම සතියකම බදාදා සහ බ්‍රහස්පතින්දා දිනයන්හිදී |
| කවුළුව විවෘතව තබන වේලාවන් | පෙ.ව. 9.00 සිට පෙ.ව. 11.00 දක්වා |
| එක් පුද්ගලයෙකුට නිකුත් කරන අවම නෝට්ටු ප්‍රමාණය | එක් මුහුණත වටිනාකමකින් (රුපියල් 20, රුපියල් 50, රුපියල් 100, රුපියල් 500, රුපියල් 1000) නෝට්ටු 100ක් අඩංගු පැකට් 1ක් වේ. |

තවද, භාවිත කල නොහැකි රුපියල් 10 නෝට්ටු විශාල ප්‍රමාණයක් දැනට සංසරණයේ පවතින බව මහ බැංකු දත්ත අනුව අනාවරණය වී ඇත. එබැවින්, ඔබ සතු භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පවතින රුපියල් 10 නෝට්ටු ළඟම පිහිටි වාණිජ බැංකුවකින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ගොඩනැගිල්ලේ පවත්වාගෙන යනු ලබන පළුදු නෝට්ටු හුවමාරු කවුළුව වෙතින් මාරු කර ගන්නා ලෙස ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ පළුදු නෝට්ටු මාරු කිරීමේ කවුළුව රජයේ සහ බැංකු නිවාඩු දිනවල හැර සෑම සතියේ දිනකම පෙ.ව. 9.00 සිට ප.ව. 12.30 දක්වා විවෘතව ඇත.

**මුදල් නෝට්ටු පිරිසිදුව හා ප්‍රවේශමෙන් පරිහරණය කරමු.**

වැඩිදුර තොරතුරු සඳහා:
අධිකාරී, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 1
☎ 0112477371/ 0112477130 @ currency@cbsl.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA